Australian Government
Department of Home Affairs

# ඔස්ට්‍රේලියාවට ඇතුළු වීම

ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමට පහත පියවර අනුගමනය කරන්න.

## 1 පියවර - ඔබේ වීසා අවශ්‍යතා පරීක්ෂා කරන්න

වීසා නොමැතිව ඕස්ට්‍රේලියාවට ගමන්කිරීමෙන් වළකින්න. ඔබට වීසා ක්‍රම බැලීමට අපගේ වීසා සෙවීම භාවිත කළහැක.

ඔබට ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමට ඉල්ලුම් කිරීමටත්, සංචාරක නිදහස් කිරීමක් **ලබා දීමටත්** අවශ්‍ය විය හැකිය. (පහත 3 පියවර බලන්න).

## 2 පියවර - ඔබේ එන්නත්කරණ අවශ්‍යතා පරීක්ෂා කරන්න

ඔබේ එන්නත්කරණ තත්ත්වය ඔස්සේ ඔබට ඕස්ට්‍රේලියාවට පැමිණීමේදී සිදුකළ යුතු දේ දැකගත හැකිය.

ඔබ ඕස්ට්‍රේලියාවේ ජ්‍යාත්‍යන්තර ගමන් සඳහා එන්නත්කරණ අවශ්‍යතා සපුරාලන්නේ නොමැති විට සලකා බැලිය යුතු තවත් දේ තිබේ. පහත පියවර අනුගමනය කරන්න.

ඔබට වෛද්‍ය හේතු මත එන්නත් කළ නොහැකි නම්, ඔබට එන්නත් කළ සංචාරකයින් හා සමාන විධිවිධානයකට ප්‍රවේශ විය හැකිය. ඔබට පිළිගත හැකි වෛද්‍ය සාධක සැපයීමට හැකි විය යුතුය. බලන්න: එන්නත්කරණය හා පරීක්ෂාව..

**පහත කරුණුවලට අදාළ නම් ඕස්ට්‍රේලියාවට පැමිණෙන වීසා හිමිකරුවන්ගේ වීසා අවලංගු වීම හෝ රඳවා ගැනීම සිදු විය හැක:**

- **ඕස්ට්‍රේලියාවේ දේශසීමා ප්‍රවේශ අවශ්‍යතාවලට අනුකූලව ජාත්‍යන්තර සංචාරක අරමුණු සඳහා සම්පූර්ණයෙන්ම එන්නත් නොකර ඇතිනම්; හෝ**
- **ඕස්ට්‍රේලියානු රජය විසින් නිර්වචනය කරන ලද පරිදි COVID-19 එන්නත සඳහා වෛද්‍ය ප්‍රතිවිරෝධතා නොමැති නම්; හෝ**
- ***නිදහස් කළ අංගයක* හෝ තනි සංචාරක නිදහස් කිරීමක් නොමැති නම්.**

## 3 පියවර - සංචාරක නිදහස්කිරීමක් සඳහා අයදුම් කිරීම

ඔබ ඕස්ට්‍රේලියාවේ එන්නත් අවශ්‍යතා සපුරාලන්නේ නැතිනම්, ඔබට ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමට සංචාරක නිදහස් කිරීමක් සඳහා අයදුම් **කිරීමටද** අවශ්‍ය විය හැක.

වැඩිදුර තොරතුරු හා අයදුම් කරන ආකාරය සඳහා ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමට නිදහස් කිරීමේ ක්‍රමවේදය බලන්න.

## 4 පියවර - ප්‍රාන්ත සහ දේශභූමිවල පැමිණීමේ අවශ්‍යතා පරීක්ෂා කරන්න

ඔබ ඔබගේ ගුවන් ගමන වෙන්කරවා ගැනීමට පෙර, ප්‍රාන්ත සහ දේශභූමිවල පැමිණීමේ අවශ්‍යතා පරීක්ෂා කරන්න. මෙයට දේශසීමා ඇතුළු වීමේ ලියාපදිංචි කිරීමේ පෝරම හෝ නිරෝධායන ඇතුළත් විය හැක.

ඔබ සංක්‍රමණය වන සහ ගමන් කරන සියලුම ප්‍රාන්ත සහ දේශභූමි පරීක්ෂා කරන්න. අවශ්‍යතා කෙටි දැනුම්දීමකින් වෙනස් විය හැක. **ඔබට නිරෝධායනයට ලක්විය යුතු විය හැක**.

ඔබට අදාළ වන සංචාරක සීමා හා අවශ්‍යතාවලට අනුගත වීම ඔබේ වගකීමකි. ඔබ ඒවාට අනුගත නොවන්නේ නම්, ඔබට සිර දඬුවම් සහ සැලකිය යුතු දඩ මුදල් ඇතුළු බරපතල දඬුවම්වලට මුහුණ දීමට සිදු විය හැක. ඒවා බලන්න: ප්‍රාන්ත සහ දේශභූමිවල ඇතුළු වීමේ අවශ්‍යතා.

## 5 පියවර - ඉදිරියට සැලසුම් කරන්න

ඔබේ ගමනේදී ප්‍රමාදය හෝ බාධාව ඇති වූ විට කුමක් සිදු කරන්නේද යන්න සලකා බැලිය යුතුය.

ගුවන් සමාගම්වලට ද ඔබ සපුරාලිය යුතු නිශ්චිත අවශ්‍යතා තිබිය හැකිය. **එන්නත් නොකළ සංචාරකයින් පැමිණෙන මගීන්ගේ සීමාවලට යටත් වන අතර ප්‍රාන්ත සහ දේශභූමි පැමිණීමේ අවශ්‍යතා සපුරාලිය යුතුය**.

අදාල නම්, ඔබට ඕස්ට්‍රේලියාවෙන් පිටවීම ට සිදුකළ යුතු දේ බලන්න.

## 6 පියවර - ඔබේ සංචාරය වෙන්කරවා ගැනීම

## 7 පියවර - ඔබේ ඩිජිටල් මගී ප්‍රකාශය සම්පූර්ණ කරන්න

ඔබට ඔබේ ගුවන් ගමනට දින හතකට පෙර ඔබේ ඩිජිටල් මගී ප්‍රකාශය (DPD) ආරම්භ කළ හැකි අතර ඔබ ඕස්ට්‍රේලියාවට පිටත් වීමට පැය 72කට පෙර එය ඉදිරිපත් කළ හැක.

DPD තීරනාත්මක සෞඛ්‍ය තොරතුරු ඉල්ලා සිටී. මෙම තොරතුරු සැපයීම බලාත්මක කළ හැකි අවශ්‍යතාවයකි. එය ඔබට ගුවන් තොටුපළේදී හෝ ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණෙන විට අනවශ්‍ය ප්‍රමාද අත්විඳීමට සිදුනොවන බව සහතික කිරීමට උපකාරී වෙයි. වැඩිදුර තොරතුරු සඳහා බලන්න: DPD.

## 8 පියවර - ගුවන් යානයට ගොඩවීමට පෙර COVID-19 පරීක්ෂණයක් සිදුකිරීම

ඔබට මෑත කාලීන සෘණාත්මක COVID-19 පරීක්ෂණයක් පිළිබඳ ගුවන් කාර්ය මණ්ඩල සාධක පෙන්වීමට අවශ්‍ය වෙයි.

ඔබට අවශ්‍ය පරීක්ෂණය කුමක්ද සහ පරීක්ෂණය කළ යුත්තේ කවදාද යන්න පිළිබඳ වැඩි විස්තර සඳහා එන්නත්කරණය හා පරීක්ෂාව බලන්න.

## 9 පියවර - ගුවන් තොටුපල සඳහා ඔබේ ලේඛන සකසා ගැනීම

ඔබ ගුවන්යානයට ඇතුළු වන විට, ගුවන් සේවකයින් විසින් ඔබෙන් පහත ඒවා ඉල්ලා සිටිනු ලැබේ:

- ගමන් බලපත්‍රය
- වීසා
- අවශ්‍ය නම් සංචාරක නිදහස් කිරීමේ අවසරය
- සෘණාත්මක COVID-19 පරීක්ෂා ප්‍රතිඵලයක්
- සම්පූර්ණ කළ DPD.

## 10 පියවර - ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම

මෙයට ආගමන, රේගු සහ ජෛව ආරක්ෂණ නිෂ්කාශනය ඇතුළත් වේ. වැඩිදුර තොරතුරු සඳහා දේශසීමා පසුකිරීම බලන්න.

## 11 පියවර - ප්‍රාන්ත සහ දේශභූමිවල පැමිණීමේ අවශ්‍යතා සපුරාලීම

බොහෝ ප්‍රාන්ත සහ දේශභූමිවල ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණීමෙන් පසු ඉක්මනින් COVID-19 පරීක්ෂණයක් කිරීමට අවශ්‍ය වේ.

**එන්නත් නොකළ සංචාරකයින් පැමිණෙන මගීන්ගේ සීමාවලට යටත් වන අතර ප්‍රාන්ත සහ දේශභූමි පැමිණීමේ අවශ්‍යතා සපුරාලිය යුතුය. ඔබට නිරෝධායනයට ලක්විය යුතු වියහැක.** ඔබ මෙය හා ඔබ සංචාරය කරනා සියලුම ප්‍රාන්ත සහ දේශභූමිවල අවශ්‍යතා ද පරීක්ෂා කළ යුතුය.

# ඕස්ට්‍රේලියාව හරහා සංක්‍රමණය වීම

## පැය 72 ක් හෝ ඊට අඩු සංක්‍රමණයක් සඳහා

ඔබ ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වන්නේ නම්, ඔබේ මූලික ප්‍රවේශයෙන් පැය 72 කට නොඅඩු ඕස්ට්‍රේලියාවෙන් පිටත් වන ගුවන් යානයක ඉදිරි ප්‍රවේශ පත්‍රයක් වෙන්කර ගැනීමට **හැකි විය** යුතුය. සුදුසු සම්බන්ධිත ගුවන් යානයක් නොමැතිනම්, ඕස්ට්‍රේලියාව හරහා සංක්‍රමණය වීම සිදුකළ **නොහැකිවෙයි**.

පැය 72 කට හෝ අඩු කාලයකදී සංක්‍රමණය වන්නේ නම් සංචාරක නිදහස් කිරීමක් සඳහා අයදුම් කිරීමට **අවශ්‍ය නොවේ**.

### වීසා අවශ්‍යතා

ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය වීමට ඔබ වලංගු වීසා බලපත්‍රයක් තිබීම හෝ වීසා නොමැතිව සංක්‍රමණ වන (TWOV) සුදුසුකම් ලත් රටක අයෙකු විය යුතුය.

ඔබට වලංගු වීසා බලපත්‍රයක් නොමැති නම් හෝ TWOV සඳහා සුදුසුකම් නොලබන්නේ නම් ඔබ ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමට වීසා බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කළ යුතුය. පැය 72ක් දක්වා ඕස්ට්‍රේලියාව හරහා සංක්‍රමණය වීමට සංක්‍රමණ වීසා (උප පන්තිය 771) සඳහා අයදුම් කරන්න.

### COVID-19 පරීක්ෂණය

ඔබට ඕස්ට්‍රේලියාව හරහා යාමට සෘණාත්මක COVID-19 පරීක්ෂණයක් අවශ්‍ය වේ. වැඩිදුර තොරතුරු සඳහා එන්නත්කරණ හා පරීක්ෂණ බලන්න.

## ඩිජිටල් මගී ප්‍රකාශය

ඔබට ඔබේ ගුවන් ගමනට දින හතකට පෙර ඔබේ ඩිජිටල් මගී ප්‍රකාශය (DPD) ආරම්භ කළ හැකි අතර ඔබ ඕස්ට්‍රේලියාවට පිටත් වීමට පැය 72කට පෙර එය ඉදිරිපත් කළ හැක.

DPD තීරනාත්මක සෞඛ්‍ය තොරතුරු ඉල්ලා සිටී. මෙම තොරතුරු සැපයීම බලාත්මක කළ හැකි අවශ්‍යතාවයකි. එය ඔබට ගුවන් තොටුපළේදී හෝ ඔබ ඕස්ට්‍රේලියාවට පැමිණෙන විට අනවශ්‍ය ප්‍රමාද අත්විඳීමට සිදුනොවන බව සහතික කිරීමට උපකාරී වෙයි. වැඩිදුර තොරතුරු සඳහා බලන්න: DPD.

## ප්‍රාන්ත සහ දේශභූමිවල අවශ්‍යතා

ඔබ පැමිණෙන ප්‍රාන්තය හෝ ප්‍රදේශය සඳහා සංක්‍රමණ අවශ්‍යතා ඔබ අනුගමනය කළ යුතුය. **එන්නත් නොකළ සංචාරකයින් පැමිණෙන මගීන්ගේ සීමාවලට යටත් වන අතර ප්‍රාන්ත සහ දේශභූමි පැමිණීමේ අවශ්‍යතා සපුරාලිය යුතුය.**

ඔබට හෝටල් නවාතැන්වල රැඳී සිටීමට අවශ්‍ය විය හැකි අතර, ඔබ ඉදිරි ගුවන් ගමන සඳහා රැඳී සිටින අතරතුර, ඔබගේ නවාතැන් සඳහා ගෙවීමට ඔබෙන් ඉල්ලා සිටිය හැක. වැඩිදුර තොරතුරු සඳහා ප්‍රාන්ත සහ දේශභූමිවල ඇතුළු වීමේ අවශ්‍යතා බලන්න.

### පැය 72 කට වඩා

ඔබේ මීළඟ ගුවන්යානයට පෙර පැය 72 ක් ඕස්ට්‍රේලියාවේ සිටී නම්, ඔබ ඕස්ට්‍රේලියාව හරහා ගමන්ගන්නා ලෙස **සලකනු නොලැබේ**.

සංක්‍රමණ, රේගු ජෛව ආරක්ෂණ නිෂ්කාශනය සහ අනිවාර්ය සෞඛ්‍ය ප්‍රකාශ ඇතුළු ඕස්ට්‍රේලියාව සඳහා අනෙකුත් සියලුම ප්‍රවේශ අවශ්‍යතා, COVID-19 එන්නත් සහ පරීක්ෂණ අවශ්‍යතා ඔබ සපුරාලිය යුතුය. වැඩිදුර තොරතුරු සඳහා දේශසීමා පසුකිරීම බලන්න.

ඔබට ප්‍රාන්ත හා ද්ශභූමි පැමිණීමේ අවශ්‍යතා ද සපුරාලීමට සිදුවේ.